# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2007 ජූලි මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ **:** රු. 4 .00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5 .00 යි.

# 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 18 වන දින]

එල්.ඩී.—ඕ. 13/2007

## 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ 6 වන වගන්තියේ (1) උපවගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2006 අංක 28 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඈඈ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (2) උපවගන්තියේ "සාමාජිකයන් තුන්දෙනකු", යන වචන වෙනුවට "සාමාජිකයන් පස්දෙනකු" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (ඈ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් ඡේද ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඈඈ) රක්ෂණ ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් තැනැත්තකු විසින් සිදු කරන ලද හෝ නිකුත් කරන ලද යම් රක්ෂණ ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවකින් පැන නගින යම් වගකීමක් සම්බන්ධයෙන් ප්‍රතිරක්ෂණය භාරගත යුතු ය;

(ඈඈඈ) මණ්ඩලය විසින් සිදුකරන ලද හෝ නිකුත් කරන ලද යම් රක්ෂණ ගිවිසුමක් හෝ රක්ෂණ ඔප්පුවකින් පැන නගින යම් වගකීමක්, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත සිටින යම් රක්ෂණකරුවකු වෙත ප්‍රතිරක්ෂණය කරනු ලැබිය හැකි ය.;".

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.